# ශ්‍රී ලාංකිකයෙකු ලෙස ඔබ.....

***කතෝලික බැතිමතුන්ගේ අසහාය නායකයා වන 23 වන ජුවාම් පාවුළු පාප්තුමා ශ්‍රී ලංකාවට සපැමිණි දිනයේ ශ්‍රී ලංකාදීප පුවත්පතේ මුල් පිටුවේ පළ වූ කවියක් කියවමින් එහි සඳහන් වන පරිදි, බුදුන් වැඩම කළ දේශයට වඩින පාප්තුමා භක්තියෙන් පිළි ගන්නා අයුරු සඳහන් වන සැටි විස්තර කරමින් මෙම කවිය ලියුවේ භික්ෂුවක නොව කතෝලික පූජකයෙකු වූ ගරු. මර්සලින් ජයකොඩි පියතුමා බවත්, පසු කලෙක තමා, "මෙහි බුදුන්ගේ පා තබා ඇත.. පියේ චේතය ධම්මදීපය" වදන් ලියුවේ කෙසේ දැයි එතුමාගෙන් විමසූ කළ "..මගේ ආගම කතෝලික වුවත් මම බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වූ කෙනෙක් මි" යන්න එතුමා විස්තර බවත් කළ හැටිත් පෙන්වා දුන්නේය.***



බර්ලින්, ශ්‍රී ලංකා සංගමය සහ බර්ලින් පාඨක පර්ෂදය මඟින් පසුගිය දා සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ වර්තමාන අර්බුදය පිළිබඳව, ප්‍රවීන සිනමා ශිල්පී සහ ද්විභාෂා ගත්කතුවරයෙකු වන ආචාර්ය තිස්ස අබේසේකරයන්ගේ සාකච්ඡාව අලලා කෙටි සටහනක් ඉදිරිපත් කිරීම සන්නස පාඨකයන්ට ද ප්‍රයෝජනවත් වේ යයි සිතමි.

එහිදී අබේසේකර ශූරීන් ඉන්දු ගංගා නිම්නය ඔස්සේ ඔරු පාරු වලින් මෙරටට පැමිණි ජනයා, එවකට ශ්‍රී ලංකාවේ සිටි ජනතාව සමඟ මිශ්‍ර වී සිංහලය භාෂාවක් හැටියට ගොඩ නගා ගත් අයුරුත්, ඉන්දියාවේ ධර්මාශෝක රජුගේ පුත් මිහිඳු හිමියන්ගේ මාර්ගයෙන් ලංකාව තුළ බුදු දහම ස්ථාපිත කිරීමත් සමඟින් බෞද්ධ සංස්කෘතිය පෝෂණය වූ අයුරුත් මැනවින් විස්තර කළේය.

අනුරාධපුර යුගයේ මෙන්ම පොලොන්නරු යුගයේදී ද මෙම ජාතිය ඉතාම දියුණු තත්වයකට පත්ව සිටි බවත්, සොබා දහමේ අඳුරු බාධකයන් හමුවේ නිවටව නොසිට, අභීතව සටන් වදිමින් ඒවා ජය ගෙන, සෑම කන්නයකටම ප්‍රයෝජනයට ගත හැකි අයුරින් ජලය රැස් කර ගත හැකි මහා සාගර මෙන් වැව් අමුණු බඳවා, ලොව විශ්මයජනක ගෘහ නිර්මාණ හා සම වන විහාර, මන්දිර ද තැනූ විශිෂ්ට ජාතියක් ලෙස ශ්‍රී ලාංකිකයන් හඳුන්වා දුන්නේ ය. බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ සිවිල් සේවය සඳහා පැමිණි ලෙනාඩ් වුල්ෆ් රචනා කළ "The Village in the jungle" නැමති කෘතියේ ඔහු මෙම නිර්මාණ, මිනිස් හස්තයෙන් කළ අග්‍රගන්‍ය නිර්මාණ ලෙසත් ලොව අනෙක් විශිෂ්ට නිර්මාණ හා සැසඳිය හැකි මට්ටමේ නිර්මාණ ලෙස ද සඳහන් කර ඇති අයුරු විස්තර කළේ ය. ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව ලෝ පුරා ප්‍රකට ශ්‍රී ලාංකිකයෙකු වන ජෙෆ්රි බාවා එම ඓතිහාසික විහාර දාගැබ් වල ඇති විශිෂ්ටත්වය පිළිබඳව ඉතා ආඩම්බරයෙන් කතා කරන බවත්, ඔහු එසේ ආඩම්බර වන්නේ ශ්‍රී ලාංකිකයෙකු වන නිසා බවත්, එසේ නොවන්නට ඔහු සිංහලයෙකුවත්, බෞද්ධයෙකුවත් නොවන බව ද පැවසීය. එමෙන්ම ඈත අතීතයේ ද්‍රවිඩ රජ දරුවන් සමඟ ඇති වූ විවාහයන් මෙන්ම ඉතිහාසයේ නම් දැරූ රජවරුනගේ සිංහල දෙමළ සම්බන්ධයන් ගැන ඉතා ගැඹුරින් පැහැදිලි කළේය.

අනුරාධපුර යුගයේත්, පොලොන්නරු යුගයේත් වෙනස්කම් සඳහන් කරමින් දේශනය පැවැත් වූ එතුමා, පොලොන්නරුව යුගයේ ඇති වූ දෙමළ බලපෑම් සාධක වශයෙන් ගෙන හැර පාමින් අනුරාධපුර යුගයේ සඳකඩ පහණේ පිළිඹිබු වන සතුන් අතර ඇති ගවයා පොලොන්නරු යුගයේ සඳකඩ පහණින් ඉවත් කර ඇති අතර, හින්දු භක්තිකයින් ශුද්ධ වූ සත්ත්වයෙකු වශයෙන් ගවයා සළකන බැවින් පෑගීමට සුදුසු නොවන නිසා එසේ කර ඇති බවත් විස්තර කළේය. එමෙන්ම අනුරාධපුර යුගයේ උපචාර සීමාවෙන් පිටත තිබූ හින්දු කෝවිල් පොලොන්නරු යුගයේ දී උපචාර සීමාවෙන් ඇතුළට ගත් සැටිත්, ජාති ආගම් බේද වලින් තොරව සෑම කෙනෙකුම අන්‍යෝන්‍ය අවබෝධයකින් සාමකාමීව ජීවත් වූ අයුරුත් විස්තරාත්මකව පැවසීය.

19 වන ශත වර්ෂයේ ලොවේ කතෝලික බැතිමතුන්ගේ අසහාය නායකයා



වන 23 වන ජුවාම් පාවුළු පාප්තුමා ශ්‍රී ලංකාවට සපැමිණි දිනයේ ශ්‍රී ලංකාදීප පුවත්පතේ මුල් පිටුවේ පළ වූ කවියක් කියවමින් එහි සඳහන් වන පරිදි, බුදුන් වැඩම කළ දේශයට වඩින පාප්තුමා භක්තියෙන් පිළි ගන්නා අයුරු සඳහන් වන සැටි විස්තර කරමින් මෙම කවිය ලියුවේ භික්ෂුවක නොව කතෝලික පූජකයෙකු වූ ගරු. මර්සලින් ජයකොඩි පියතුමා බවත්, පසු කලෙක තමා, "මෙහි බුදුන්ගේ පා තබා ඇත.. පියේ චේතය ධම්මදීපය" වදන් ලියුවේ කෙසේ දැයි එතුමාගෙන් විමසූ කළ "..මගෙ " ආගම කතෝලික වුවත් මම බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වූ කෙනෙක් මි" යන්න එතුමා විස්තර බවත් කළ හැටිත් පෙන්වා දුන්නේය.

මෙසේ සෑම ජාතියක්ම සහ ආගමක්ම උදාහරණයට ගනිමින් ආචාර්ය තිස්ස අබේසේකරයන් උත්සාහ දැරූයේ ශ්‍රී ලංකා ශිෂ්ටාචාරය තනි ඉරක් වශයෙන් නොව අලංකාර රශ්මි කදම්බයන් එකතු වී, වර්ධනය වී දිදුලන රැස් දහරාවක් ලෙස සනාථ කිරීමට ය. වර්තමාන ශ්‍රී ලංකාවේ ජීවත් වන සෑම ජන වර්ගයකටම ශ්‍රී ලාංකිකයින් වශයෙන් ආඩම්බර විය හැකි බවත්, යථාර්තය එලෙසින් පිළි ගෙන සාමකාමීව, සහජීවනයෙන් ජීවත්වීමට සෑම කෙනෙකුම උත්සාහ දරන්නේ නම් එය රටේම සුබ සිද්ධියට රුකුලක් බවත්, ඉන් රට තුළ පවතින වර්තමාන අර්බුදය සමතයකට පත් කර ගත හැකි බවත් අවධාරණය කළේය.

මෙම සාකච්ඡාවට සහභාගී වූ බොහෝ පිරිසක් විවිධ ගැටළු ඉදිරිපත් කළ අතර තවත් එක් ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ශ්‍රී ලංකාවේ වර්තමාන අර්බුදයට අනිවාර්යයෙන්ම දේශපාලන විසඳුමක් අවශ්‍ය බවත්, යුද්ධයකින් ඕනෑම රටක් තුළ ආර්ථික මෙන්ම සමාජයීය පිරිහීම් සිදු වන බවත්, දිගුකාලීන යුද පසුබිමක් තුළ ඒකාධිපතිත්වය හිස එසවීමත් නිසා සමාජ සාරධර්ම පිරිහී එවන් සමාජයන් ඉතා අඳුරු ආගාධයන්ට ඇද වැටෙන අයුරු තමා අධ්‍යනය කර තිබෙන බවත් ශ්‍රී ලංකාවට එවන් ඉරණමක් අත් නොවන්නට නම් කිසිදු බේදයකින් තොරව ශ්‍රී ලාංකිකයින් එකමුතු විය යුතු බවත් සඳහන් කළේ ය.

රොයිස්ටන් ප්‍රනාන්දු

(බර්ලින් පාඨක පර්ෂදය වෙනුවෙන්)

Jayapathi Associates
LAWYERS & MIGRATION AGENTS
For all legal and migration matters

Jayantha Wijethilake
MARN: 0848808
Mobile: 0439 390 533
Email: jay@jayapathi.com.au

Athula Pathinayake
MARN: 0320189
Mobile: 0407 314 265
Email: athula@jayapathi.com.au

General enquiries
Telephone: 03 9888 8366
Email: enquiry@jayapathi.com.au

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා
Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ
DENTIST
Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care
1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760
Sannasa